# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# ANNUAL PERFORMANCE REPORT

# 2023 වර්ෂය



පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන, සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය.

උතුරු මැද පළාත.

# 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

**පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, උතුරු මැද පළාත.**

වැය ශීර්ෂ අංකය - 620

## අන්තර්ගතය


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය.

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

## 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. ආයතනය පිළිබඳ හැඳින්වීම

පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන සහ සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ජාතික ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් පළාත් ප්‍රතිපත්ති ක්‍රියාවට නංවාලන උතුරු මැද පළාතේ කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු යන අංශයන්ගෙන් පළාත සංවර්ධනය කරා මෙහෙයවනු ලබන බලාත්මක පළාත් රාජ්‍ය ආයතනය වේ. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන දෙක වන අතර, පළාතේ මිරිදිය ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්තයට අදාළ වැඩසටහන් අමාත්‍යාංශය මඟින් සිදුකෙරේ.

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය සඳහා විශාල කාර්යභාරයක් ඉටුකරනු ලබන අතර, ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික නිෂ්පාදන හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම, අලෙවිය හා තාක්ෂණික සංවර්ධනය, කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත වැඩිදියුණු කිරීම, කෘෂිකර්මය ආශ්‍රිත ආයතනවල කටයුතු ශක්තිමත් කිරීම යන ප්‍රධාන ක්ෂේත්‍ර ඔස්සේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබයි. නියෝජ්‍ය කෘෂිකර්ම ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය හා මහ ඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය හා සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 6 ක් හා කෘෂිකර්ම උපදේශන කාර්යාල 32 ක් ඔස්සේ කෘෂිකාර්මික ජනතාව වෙනුවෙන් සේවා සැපයීම් සිදු කරනු ලබයි.

එමෙන්ම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සම්බන්ධ සංවර්ධන කටයුතු සිදුකරනු ලබන අතර, ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත තුළ පශු සම්පත් නිෂ්පාදනය හා ඵලදායිතාව වර්ධනය, සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත ආදායම් උත්පාදන හා අලෙවි වැඩසටහන්, සත්ත්ව සෞඛ්‍ය සංවර්ධනය හා ආයතනික ධාරිතාව වැඩිදියුණු කිරීම වැනි සංරචක ඔස්සේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය අනුරාධපුර, දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය පොලොන්නරුව, තිරප්පනේ සත්ව ගොවිපළ, පශු වෛද්‍ය රෝහල හා පශු වෛද්‍ය කාර්යාල 29 ක් ඔස්සේ සේවා සැපයීම් සිදු කරනු ලැබේ.

මිරිදිය ධීවර විෂයට අදාළව ධීවර නිෂ්පාදිත වර්ධන වැඩසටහන්, අලෙවි ප්‍රවර්ධන හා ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයුම් හා අධීක්ෂණ ක්‍රියාවලිය ද

අමාත්‍යාංශය මඟින් සිදුකෙරේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව මුහුණ දී ඇති වත්මන් ආර්ථික හා සමාජයීය අර්බුදකාරී වාතාවරණය තුළ පළාතේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණ අවශ්‍යතා සපුරාලීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සතු සුවිශාල වගකීමකි. එමෙන්ම පළාතේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ව්‍යවසායකයන් මෙහෙයවීම හා අධීක්ෂණය, ඔවුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, පසු විපරම් කටයුතු හා ඔවුන්ගේ කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමද අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි.

සියලු සංවර්ධන කාර්යයන් සඳහා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනවලද සහයෝගය ලබා ගනිමින් පළාතේ කෘෂි, සත්ත්ව නිෂ්පාදන සහ ධිවර අංශ පුළුල්කර ප්‍රධාන වශයෙන් ස්වයංපෝෂිත ආර්ථිකයක් තුළින් පළාතේ ජන දිවිය ශක්තිමත් කිරීම අමාත්‍යාංශයේ අරමුණ වී ඇත.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම** - "ඉසුරුමත් භූමියක්, අසිරිමත් ගොවි කැළක්."

**මෙහෙවර** - "කෘෂිකර්ම, කෘෂි හා සත්ව නිෂ්පාදන ප්‍රවර්ධන හා අලෙවි. සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

**අරමුණු**

දිගු කාලීන අරමුණු :-

- ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් පළාත් ප්‍රතිපත්ති භාවිතා කරමින් වැඩ සටහන් සැලසුම් කර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සම්ප්‍රදායන් රැක ගනිමින් සහ නවීන තාක්ෂණයට අනුගත වෙමින් කෘෂිකර්මාන්තයේ ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම .
- පළාතේ 80% ක් පමණ වූ ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම .
- තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගත හැකි පරිදි කෘෂිකාර්මික වැඩසටහන් සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය.
- ධීවර කර්මාන්තයේ මිරිදිය ධීවර කර්මාන්ත තුළ ජාතික නිෂ්පාදනය සඳහා වැඩිම දායකත්වයක් සපයන පළාත බවට පත්කිරීම .
- ධීවර හා විසිතුරු කර්මාන්තයේ නියැලෙන පවුල්වල සමාජ ආර්ථික පසුබිම සංවර්ධනය කිරීම.

කෙටි කාලීන අරමුණු :-


- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දෙක මගින් සිදු කරනු ලබන සංවර්ධන වැඩ සටහන් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් වර්ෂය තුල නිම කිරීම.
- නව කෘෂි නිෂ්පාදන ක්‍රමවේද / තාක්ෂණය පිළිබඳ ව දැනුමෙන් පිරි ගොවි ජනතාවක් බිහිකර ගැනීම.
- වස විස නැති ආහාර පරිභෝජනයට යොමු වන පිරිස වර්ධනය කිරීම.
- සුළු පරිමාණ ව්‍යවසායකයින්ට අවශ්‍ය අනුබල සැපයීම තුලින් ඔවුන්ගේ ආර්ථිකමය හැකියාව ශක්තිමත් කිරීම.
- මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීම මගින් ජාතික නිෂ්පාදනයට පළාතේ දායකත්වය වර්ධනය කිරීම .
- මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම මගින් පළාතේ ජනතාවගේ පෝෂණ මට්ටම ඉහල නැංවීම.
- ධීවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.
- විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයන්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම.
- දේශීය මෙන්ම විදේශීය වෙළඳපළ අරමුණු කර ගනිමින් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම.

## 1.3 ආයතනයේ ප්‍රධාන කාර්යයන්

- ආයතනයේ හා දෙපාර්තමේන්තු දෙකෙහි පරිපාලන කටයුතු සිදු කිරිම.
- පිරිස් පාලන කටයුතු සිදු කිරීම.
- මූල්‍ය පාලන කටයුතු.
- කෘෂි, සත්ත්ව හා ධීවර ක්ෂේත්‍රයන්හි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
- අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු නියාමනය සහ කාර්යක්ෂම සේවාවක් සපයන ආයතනයක් බිහිකිරිම.
- ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය.
- කෘෂි අශ්‍රිත නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා ආයතනික භෞතික සම්පත් සංවර්ධනය.

**1.4** සංවිධාන සටහන

<u>උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සංවිධාන සටහන</u>



## 1.5 සේවා ජාලය

1.5.1 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, දෙපාර්තමේන්තු වල ප්‍රධාන අංශ, උප කාර්යාල, ව්‍යවස්ථාපිත ආයතන හා වෙනත් ආයතන හෝ සංවිධාන.

I. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

II. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1.5.2 දෙපාර්තමේන්තු - දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ, උප කාර්යාල, ව්‍යවස්ථාපිත ආයතන හා වෙනත් ආයතන හෝ සංවිධාන.

I. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

- නියෝජ්‍ය කෘෂිකර්ම ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය හා මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය.
- සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය 6 ක් හා කෘෂිකර්ම උපදේශන කාර්යාලය - 37 (අනුරාධපුර- 32, පොලොන්නරුව -5 )

II. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

- දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර.
- දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, පොළොන්නරුව.
- සත්ත්ව ගොවිපළ, තිරප්පනේ.
- පශු වෛද්‍ය කාර්යාල -29
- පශු වෛද්‍ය රෝහල, අනුරාධපුර

1.5.3 ව්‍යවස්ථාපිත ආයතන - යටතේ පවතින වෙනත් ආයතන හෝ සංවිධාන

- නැත

1.5.4 පළාත් පාලන ආයතන - යටතේ පවතින වෙනත් ආයතන හෝ සංවිධාන

- නැත

**1.6 අමාත්‍යංශය/ දෙපාර්තමේනතුව/ ව්‍යවස්ථාපිත ආයතනය/පළාත් පාලන ආයතනය සඳහා අරමුදල්ලැබෙන ප්‍රභවයන්**

- සාමූහික ප්‍රධාන - 22
- පළාත් සභා සංවර්ධන ප්‍රධාන - 23
- පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන - 24
- ලෝක බැංකු ආධාර - 33

**1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති.**

අ) ව්‍යාපෘතියේ නම - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය.(CSIAP)

ආ) දායක නියෝජිතායතනය - ලෝක බැංකු ආධාර හා ශ්‍රී ලංකා රජය.

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - ඇමරිකා ඩොලර් මිලියන 125.

ඈ) ව්‍යාපෘති කාල සීමාව - 2019 සිට 2024 දක්වා

## 02. පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම.

**ප්‍රගතිය පිළිබඳ කරුණු 4ක් ඔස්සේ සාකච්ඡා කළ හැකිය.**

### 1. ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් මුදාහැරීම.

පළාතේ මත්ස්‍ය නිෂ්පාදිතය ඉහල නැංවීමේ අරමුණින් 2023 වසරේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරා ගන්නා ලද වැව් 45ක් සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් 3,829,770 ක් මුදාහැරීම සිදුකර ඇති අතර ,මෙහිදී ප්‍රධාන වශයෙන්ම තිලාපියා ,කැට් හා කාප් වර්ගයේ ඇඟිල්ලන් මුදාහැරීම සිදුවී ඇත . 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී පළාතේ මත්ස්‍ය නිෂ්පාදිතයේ සුළු පසුබෑමක් පෙන්නුම් කල ද ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් මුදාහැරීමේ ක්‍රමවේදය ඉදිරි වර්ෂයන්හි නිෂ්පාදිත වර්ධනය කෙරෙහි ඍජු දායකත්වයක් සපයනු ඇත.



මත්ස්‍ය ඇඟිල්ලන් බහාලීම.



ජලාශ වෙත මුදාහැරීමට යෝග්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් ගණනයට ලක් කිරීම.

2. **පෞද්ගලික මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථා 10 ක් සංවර්ධනය කිරීම.**

වැව් හා ජලාශ ඉතා විශාල සංඛ්‍යාවකින් සමන්විත උතුරු මැද පළාත මිරිදිය ධීවර නිෂ්පාදනය කෙරෙහි ඉතා විශිෂ්ට වූ හිතකර පාරිසරික විභවතාවයකින් සමන්විත පළාතකි .දැනට සමස්ත දිවයිනේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතයට % 30ක් පමණ වූ දායකත්වයක් සැපයුව ද තව දුරටත් ඉතා ඉහල නිෂ්පාදන ධාරිතාවයක් අත්කර ගැනීමේ හැකියාව පළාත සතුව ඇත .ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් මුදාහැරීමේ ක්‍රියාවලිය ඉහල නිෂ්පාදන මට්ටමක් කරා අතිශයින් ම වැදගත් කාර්යභාරයක් සිදුකරයි .පළාත සතු වැව් හා ජලාශවලින් දැනට මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් මුදාහැරීමේ කටයුතු සිදුකිරීමේ හැකියාව පවතිනුයේ ඉතා සුළු ජලාශ ප්‍රමාණයක පමණි .ප්‍රමාණවත් පරිදි මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් නිෂ්පාදනය තුළින් තවත් ජලාශ රැසකට ප්‍රතිලාභ අත්කර දීමේ හැකියාව ජනනය වේ.

2023 වසරේදී පෞද්ගලික මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 10 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන ලද්දේ මෙම ගැටළුවට පිළියමක් ලෙසිනි .මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 10 ක් සංවර්ධනය කිරීමට ඉලක්ක කරගත් අතර ,අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ,පලාගල ,විලච්චිය හා රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලත් ,පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අභිජනන මධ්‍යස්ථාන 02ක් සහ වැලිකන්ද හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හිත් මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන එක බැගින් සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලදි .

මෙම අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය මඟින් ඉතා පහසුවෙන් පළාතට අවශ්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව මෙන්ම එම ව්‍යවසායකයන් මඟින් ග්‍රාමීය සේවා නියුක්ති අවස්ථා පුළුල් වීම හා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම ද අපේක්ෂිතය.

2023 වසරේදී සංවර්ධනය කිරීමට සැලසුම් කරන ලද අභිජනන මධ්‍යස්ථාන අතරින් දිඹුලාගල හා පලාගල ව්‍යවසායකයන් දෙදෙනෙකුගේ ඉඩම් වසරේ අවසන් කාල පරිච්ඡේදය තුළ දී පළාතට ලැබුණ අධික වර්ෂාවෙන් යටවීම හේතුවෙන් සාර්ථක කර ගැනීමේ හැකියාවක් නොලැබුණි.

3. **ධීවර කාර්මිකයින් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම.**

ආර්ථික අපහසුතා මැද ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවර කාර්මිකයනට ආර්ථික ශක්තියක් වෙමින් ඔවුනගෙන් තෝරාගත් නිෂ්පාදකයන් 200 ක් සඳහා ධීවර ඔරු සහ දැල් 50% ප්‍රතිලාභී දායකත්වය මත ලබා දීම සිදුකර ඇත.



ධීවර උපකරණ බෙදා දීම.

4. **විසිතුරු මත්ස්‍ය වගාකරුවන් ප්‍රවර්ධනය සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය.**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ප්‍රතිලාභීන් 26ක් සහ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 23ක් ද ,දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 17ක් ,මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 03ක් සහ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 06ක් ද ලෙස පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 49ක් ද ලෙස පළාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් 75ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි .

මෙහිදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයන් සඳහා කුරුළු දැල් 20ක් ,සෙවන දැල් 30ක් සහ වටදැල් 84ක් ද ,පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයන් සඳහා කුරුළු දැල් 80ක් ,සෙවන දැල් 45ක් සහ වටදැල් 266ක් ද ,ලෙස උපකරණ ලබා දෙමින් විසිතුරු මත්ස්‍ය වගාකරුවන් ප්‍රවර්ධනය සඳහා පියවර ගන්නා ලදි.



විසිතුරු මත්ස්‍ය වගා උපකරණ බෙදාදීම.







නිෂ්පාදනය කරනු ලබන විසිතුරු මසුන් වර්ග කිහිපයක්

- **මිරිදිය ධීවර හා විසිතුරු මත්ස්‍ය අංශයේ ඉදිරි වැඩසටහන්**

උතුරු මැද පළාත තුළ මිරිදිය මෙන්ම විසිතුරු මත්ස්‍ය කර්මාන්තයන් වැඩි දියුණු කර ආර්ථිකයට විශාල දායකත්වයක් දැක්වීම උදෙසා පහත සඳහන් වැඩසටහන් මෙම වසර තුළ ක්‍රියාත්මක කිරීම.

01. උතුරුමැද පළාත් ළමා මෙන්ම, වැඩිහිටි ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම මෙන්ම ආර්ථික සංවර්ධනයට දායක වන මිරිදිය මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් තෝරාගත් ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීමේ ව්‍යාපෘතිය. (මේ සඳහා 2024 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.මි.23ක් වැය කිරීමට අපේක්ෂිතය.)

02. අපනයන ආර්ථිකයට අත්වැලක් වෙමින් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වඩාත් ගුණාත්මක බවින් යුත් විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනයක් කරා යොමු වීමට විසිතුරු මත්ස්‍ය වගා කරුවන් වෙත ආනයනික මවු සතුන් ලබා දීම. (වැය කිරීමට අපේක්ෂිත මුදල රු.මි.10කි)

03. පළාතේ ජලාශ සඳහා මුදාහැරීමට පහසුවෙන් මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.(වැය කිරීමට අපේක්ෂිත මුදල රු.මි.10කි.)

04. කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම. (වැය කිරීමට අපේක්ෂිත මුදල රු.මි.5කි.)

05. නව තාක්ෂණික දැනුම ලබා දී විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් වගාකරුවන් සඳහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. (වැය කිරීමට අපේක්ෂිත මුදල රු.මි.5කි.)

ඩබ්.ජී.ඩබ්.වනසිංහ.
ලේකම් ,
කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා
සත්ව සෞඛ්‍ය,සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

**03. පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

**3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

**එන්සීපී-පීටී (එෆ්)**

**පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අළෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය**

**උතුරු මැද පළාත.**

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2022 | | සටහන | තත්‍ය 2023 | තත්‍ය 2022 | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | ආර්-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 1 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 2 | - | - | ආර්-1 |
| **-** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **-** | **-** | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| 1,396,585,826 | භාණ්ඩාගාර අග්‍රිම | | 1,153,949,000 | 308,300,000 | **ජී-1** |
| - | තැන්පතු | | 12,853,473 | 3,008,652 | **ජී-2** |
| 1,500,000 | අත්තිකාරම් ලැබීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | | 2,547,655 | 3,735,614 | **ජී-3** |
| - | අත්තිකාරම් ලැබීම් - අනුදත් අත්තිකාරම් | | - | - | **ජී-3** |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| **1,398,085,826** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,169,350,128** | **315,044,266** | |
| **1,398,085,826** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,169,350,128** | **315,044,266** | |
| - | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)** | | 7,505,137 | 178,804 | |
| **1,398,085,826** | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)** | | **1,161,844,991** | **314,865,462** | |

**අඩුකළා : වියදම්**
**පුනරාවර්තන වියදම්**

| | | | | | |
|---|---|---|---|---|---|
| 37,254,560 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 3 | 29,911,985 | 30,645,677 | |
| - | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ - වෙනත් දෙපා: | 3 | - | 255,640 | |
| 15,176,600 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 4 | 6,976,826 | 7,158,750 | ඊ-3 |
| - | අනෙකුත් භාණ්ඩ හා සේවා - වෙනත් දෙපාර්තමේන්තු | 4 | - | - | |
| 3,354,666 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 5 | 347,656 | 215,479 | |
| - | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් - වෙනත් දෙපාර්තමේන්තු | 5 | - | 4,338 | |
| **55,785,826** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **37,236,467** | **38,279,884** | |
| | **මූලධන වියදම්** | | | | |
| 3,250,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 6 | - | - | |
| 86,087,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 7 | 860,830 | - | |
| - | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් - වෙනත් දෙපාර්තමේන්තු | 7 | 62,786,744 | 2,025,995 | |
| 1,250,763,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 8 | 1,112,187,542 | 271,000,000 | ඊ-3 |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් - වෙනත් දෙපාර්තමේන්තු | 8 | 42,433,259 | 11,665,469 | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 9 | - | - | |
| 200,000 | හැකියා වර්ධනය | 10 | - | - | |
| - | වෙනත් මූලධන වියදම් | 11 | - | - | |
| **1,340,300,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **1,218,268,375** | **284,691,464** | |
| - | තැන්පතු ගෙවීම් | | 11,690,312 | 4,587,686 | **ජී-2** |
| 2,000,000 | අත්තිකාරම් ගෙවීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | | 2,092,324 | 2,904,676 | **ජී-3** |
| - | අත්තිකාරම් ගෙවීම් - අනුදත් අත්තිකාරම් | | - | - | **ජී-3** |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| **2,000,000** | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **13,782,636** | **7,492,362** | |
| **1,398,085,826** | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **1,269,287,478** | **330,463,710** | |
| **-** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(107,442,487)** | **(15,598,248)** | |
| - | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ගැලපුම් ශේෂය** | | (108,515,336) | (16,671,097) | **ජී-5** |
| - | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 1,072,849 | 1,072,848 | **ජී-1** |
| - | | | **(107,442,487)** | **(15,598,248)** | |

**3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

**එන්සීපී-පීටී (පී)**

**පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අළෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය, උතුරු මැද පළාත.**
**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය<br>**2023**<br>රු. | **2022**<br>රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | එන්සීපී-පීටීජී(4) | 62,200,627 | 61,509,998 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | එන්සීපී-පීටීජී-3 | 6,517,406 | 6,972,736 |
| මුදල් හා මුදල් සමාන දෑ | එන්සීපී-පීටීජී-1 | 1,072,848 | 1,072,848 |
| **මුළු වත්කම්** | | **69,790,881** | **69,555,582** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| පළාත් භාණ්ඩාගාර(යට/යෙන්) පියවියයුතු/ ලැබියයුතු ශුද්ධ වත්කම | | 5,166,418 | 6,784,909 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 62,200,627 | 61,509,998 |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | එන්සීපී-පීටීජී-2 | 1,350,988 | 187,827 |
| අග්‍රිම ශේෂය | එන්සීපී-පීටීජී-1 | 1,072,848 | 1,072,848 |
| **මුළු වගකීම්** | | **69,790,881** | **69,555,582** |

පිටු අංක 06 සිට 77 දක්වා එන්සීපී-පීටීආර් (1) සිට එන්සීපී-පීටීජී (7) දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 78 සිට 85 දක්වා ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදු කර ඇති අතර, මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා නිවැරදි බවටත් මෙයින් සහතික කරමි.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| …………………… | ……………… | ……………………………….. |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2024.05. | දිනය : 2024.05. | දිනය : 2024.05. |

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**එන්සීපී-පීටී (සී)**

**පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අළෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය,උතුරු මැද පළාත.**

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | **2023** රු. | **2022** රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් - වැන්දඹු අනත්දරු දායක | 1,201,243 | 1,237,791 |
| වෙනත් පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 1,345,283 | 5,872,308 |
| අග්‍රිම ලැබීම් | 1,153,949,000 | 308,300,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 2,199,714 | 2,937,629 |
| අත්තිකාරම් අයකර ගැනීම් - අනුදත් අත්තිකාරම් ගිණුම් | - | - |
| තැන්පතු ලැබීම් | 12,853,473 | 3,008,652 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **1,171,548,713** | **321,356,380** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 36,888,811 | 37,804,428 |
| සහනාධාර සහ මාරුකිරීම් | 347,656 | 215,479 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද මෙහෙයුම් වියදම් | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 7,505,137 | 178,804 |
| අත්තිකාරම් ගෙවීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 2,092,324 | 2,904,676 |
| අත්තිකාරම් ගෙවීම් - අනුදත් අත්තිකාරම් ගිණුම් | - | - |
| තැන්පතු ගෙවීම් | 11,690,312 | 4,587,686 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **58,524,240** | **45,691,073** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **1,113,024,473** | **275,665,307** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 23,900 | - |
| උපණය අයකර ගැනීම් | - | - |

| | | |
|---|---|---|
| ආයෝජන ආපසු ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **23,900** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 1,113,048,372 | 271,000,000 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වියදම් | - | 4,665,308 |
| වර්ෂය තුල ආයෝජනවල යෙදවුම් - මුදලින් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **1,113,048,372** | **275,665,308** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(1,113,024,472)** | **(275,665,308)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **1** | **(1)** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු, වෙනත් වගකීම්, මුදල් හැර ජංගම වත්කම් වලින් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු, වෙනත් වගකීම්, මුදල් හැර ජංගම වත්කම් වලට ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **1** | **(1)** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **1,072,848** | **1,072,848** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **1,072,849** | **1,072,847** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2023 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 **ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය. (අදාල නොවේ)**

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද මුළු ආදායම (රු.) | එකතු කරන ලද මුළු ආදායම අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | | |
| - | - | - | - | - | - |

3.6 **ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ කාර්ය සාධනය.**

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝජනය කරනු ලැබූ ප්‍රතිපාදනය වෙන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන** | 57,314,000 | 55,785,826 | 37,236,467 | 66.74% |
| **මූලධන** | 244,500,000 | 1,340,300,000 | 1,218,268,374 | 90.89% |
| **එකතුව** | **301,814,000** | **1,396,085,826** | **1,255,504,841** | **89.93%** |

| වැඩසටහන් නාමය * | පුනරාවර්තන | | | මූලධන | | |
|---|---|---|---|---|---|---|
| | 2023 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | 2023 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම |
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | |
| පළාත් සභා පරිපාලනය | 59,814,000 | 58,285,826 | 38,097,297 | - | - | - |
| කෘෂිකර්ම සංවර්ධනය | - | - | - | 151,000,000 | 1,246,800,000 | 1,185,347,785 |
| පශු සම්පත් සංවර්ධනය | - | - | - | 91,000,000 | 91,000,000 | 32,059,759 |

*වාර්ෂික මුදල් ප්‍රකාශයේ පිටු අංක **XIV** හි වර්ගීකරණය අනුව.

**3.7 ප.මු.රී 140 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේනතු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.**

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගනය කර ගන්නා ලද ප්‍රතිපාදන, වෙන් කර දුන් අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| - | - | -. | - | - | - | - |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.**

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා වැය විෂයට ගිණුම්ගතවූ ශේෂය | 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා වත්කම් කළමනාකරණ මෘදුකාංගයට ඇතුලත් කල ශේෂය | 2023.12.31 දිනට වියදම් ලෙස ගිණුම් ගත උවද වත්කමක් ලෙස වාර්තා නොවූ ශේෂය (වත්කම් කළ.මෘදුකාංගයට ඇතුලත් නොවූ වටිනාකම) | වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරණ ලද වියදම වත්කම් කළ. මෘදු.හරහා වාර්තා කිරීමේ ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| 2101 | වාහන | - | - | - | - |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 733,500 | 733,500 | - | - |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 127,300 | 127,300 | - | - |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | - | - | - | - |
| 2105 | ඉඩම් අත්පත් කර ගැනීම | - | - | - | - |
| 2106 | වෙනත් මූලධන වත්කම් | - | - | - | - |
| 2107 | යටිතල පහසුකම් වත්කම් | | - | - | |
| 2108 | කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම | - | - | - | - |
| 2109 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |

**3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. — NCPC/D/PAM/FA2023/2024/01 | ඔබේ අංකය / உமது இல. / Your No. — | දිනය / திகதி / Date — 2024 මැයි 23 දින |

ලේකම්,

කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,

උතුරු මැද පළාත.

**ශීර්ෂය - 620 –කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

---

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ 2023 දෙසැම්බර් 29 දිනැති අංක 2023/12 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර ඉදිරිපත් කරන ලද 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. මෙහි ඇතුළත් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ, පළාත් සභාවේ අනෙකුත් ආයතනවලින් අනාවරණය වන ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සමඟ සම්පිණ්ඩනය කර පළාත් සභාවේ අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් කරනු ලැබේ. එම විගණකාධිපති වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ප්‍රධාන ලේකම්ගේ 2023 දෙසැම්බර් 29 දිනැති අංක 2023/12 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල මූල්‍ය ප්‍රකාශ වලින් 2023 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන ඡේදයේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි ප්‍රධාන ලේකම්ගේ 2023 දෙසැම්බර් 30 දිනැති අංක 2022/14 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ /ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ /ගණන් දීමේ නිලධාරී ගේ වගකීම වේ.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති

විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

02. මූල්‍ය සමාලෝචනය

2.1. වියදම් කළමනාකරණ

2.1.1. ඇස්තමේන්තු පිළියල කිරීමේ දුර්වලතා

උතුරු මැද පළාත් මූල්‍ය රීති 5.3 ප්‍රකාරව, වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට පෙර ඉකුත් වර්ෂවල තථ්‍ය වියදම් සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂයේ දැරීමට අපේක්ෂිත වියදම් පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් හා පුරෝකථනයක් තුළින් ප්‍රතිපාදන වෙන් කර ගැනීමට ගණන්දීමේ නිලධාරියා වගබලා ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී පහත දැක්වෙන පරිදි පරිපූරක ප්‍රතිපාදන ලබා ගැනීම් සහ පළාත් මූල්‍ය රීති 29 හා 30 මඟින් ප්‍රතිපාදන අඩු/වැඩි කර ගැනීම් තත්ත්වයන් පැවතීමෙන් එලෙස කටයුතු කර නොමැති බවට නිරීක්ෂණය විය.

(අ). අයවැය මඟින් ප්‍රතිපාදන වෙන්කර නොමැති වැය විෂයයන් සඳහා පළාත් මූල්‍ය රීති 29 හා 30 මඟින් ප්‍රතිපාදන මාරු කිරීම.

අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් නොකරන ලද වැය විෂයයන් 02 ක් සඳහා පළාත් මූල්‍ය රීති 29 හා 30 ප්‍රකාරව වෙනත් වැය විෂයයන් මඟින් රු.22,000,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි.

(ආ). අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කළ නමුත් ඉතිරි වූ වැය විෂයයන්

අයවැය මඟින් රු.36,265,161ක් ප්‍රතිපාදන වෙන් කරන ලද වැය විෂයයන් 03ක රු23,700,400 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 62 සිට සියයට 100 දක්වා විය.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

3.1.1. කාර්යභාරයන් ඉටු නොකිරීම.

වැය විෂයය 620-44-04-2201(ii) යටතේ වූ දේශගුණික යුහුරු වාරි කෘෂිකර්ම උතුරු මැද පළාත් ව්‍යාපෘති කාර්යාලය විසින් 2023 යල කන්නය සඳහා ගොවීන් වෙත බෙදා දීමට මිලදී ගෙන තිබූ රු.5,256,246 ක වටිනාකමක් සහිත බීජ යල කන්නයේ බීජ සිටුවීමේ කාලය අවසන් වී මාස 02ක පමණ කාලයක් ගත වී තිබියදීත් ගොවීන් වෙත බෙදා දී නොතිබුණි.

3.2. ප්‍රසම්පාදනයන්

-----------------

(අ). වැය විෂයය 620-44-04-2201(ii) යටතේ වූ දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මඟින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර කොන්ත්‍රාත්කරුවන් තෝරා ගන්නා ලද දිවුල්වැව කමත සහ පරංගියාවාඩිය කමත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු 02 සඳහා ලැබී තිබූ සුදුසුකම්ලත් අවම ලංසුකරුවන් තිදෙනෙකු ප්‍රතික්ෂේප කර 04 වන ලංසුකරුවන් වෙත එම කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුවන් ප්‍රතික්ෂේප කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ දැක්වෙන කරුණු සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛනමය සාක්ෂි නොතිබීම හේතුවෙන් එම ලංසුකරුවන් ප්‍රතික්ෂේප කිරීමට දක්වා තිබූ හේතු පිළිගත නොහැකි බැවින් එම කොන්ත්‍රාත් 02 සඳහා පිළිවලින් ව්‍යාපෘති අරමුදලට රු.906,451 ක් සහ රු.1,100,116 ක් ලෙස එකතුව රු.20,006,567 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ). වැය විෂයය 620-44-04-2201(ii) යටතේ වූ දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මඟින් ගොවීන් වෙත බෙදා හැරීමට බීජ වර්ග මිල දී ගැනීම සඳහා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ඒ සඳහා සකස් කළ ටෙන්ඩර් ලියවිලි අනුව බීජ සැපයුම්කරුවන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි බීජ සැපයුම්කරුවන් විය යුතු වුවත්, රෝපණ බීජ සැපයුම් සඳහා සැපයුම්කරුවන් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහතිකය නොමැති සීමාසහිත අනුරාධපුර ග්‍රාමීය බැංකු සංගමය මඟින් රු.2,435,000ක මුං ඇට බීජ කිලෝ ග්‍රෑම් 1,250 සහ රු.2,640,000 ක් වටිනා බී ලූනු බීජ කිලෝ ග්‍රෑම් 80 ක් මිලදී ගෙන තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය මත බෙදා හැර තිබූ අතර එම ලොකු ලූනු බීජ කල් ඉකුත් වීමට ආසන්න දිනවල පැවති අතර, මුං ඇට බීජ ගුල්ලන් විසින් විනාශ කර තිබූ බීජ බවද නිරීක්ෂණය විය.

3.3. කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

(අ). වැය විෂයය 620-44-04-2201(ii) යටතේ වූ දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මඟින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කරන ලද කමත් ඉදිකිරීමේ උප ව්‍යාපෘතිය මඟින් කැලැනිකවැව, මීකුඹුක්වැව හා අඹගස්වැව යන ස්ථානවල ධාන්‍ය වියළීම සඳහා කමත් ඉදිකිරීමට කොන්ත්‍රාත් ලබාදී තිබූ නමුත්, ක්‍රියාත්මක නොකළ කොන්ත්‍රාත් 03 වෙනුවෙන් ගෙවා තිබූ බල මුළු ගැන්වීමේ අත්තිකාරම් (Mobilization Advance) වටිනාකම වූ රු.3,575,068 ක මුදලින් කොන්ත්‍රාත්කරුවන් පැහැර හැරීම නිසා තවදුරටත් අයකරගත යුතු වටිනාකම රු.2,575,068 ක් ව තිබුණි. එම කොන්ත්‍රාත් 03 වෙනුවෙන් අත්තිකාරම් ගෙවීම් සඳහා ලබාගත් මුදලින් රු.2,575,068ක වටිනාකමක් සහ කොන්ත්‍රාත් 02 ක් වෙනුවෙන් ලබාගෙන තිබූ රු.462,281 කාර්ය සාධන බැඳුම්කර මුදල් කරගෙන ප්‍රසම්පාදන අස්ථිත්වයට සිදුවූ පාඩුව පියවාගෙන නොතිබුණි.

(ආ). වැය විෂයය 620-44-04-2201(ii) යටතේ වූ දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මඟින් පරංගියාවාඩිය නිකවැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.12,820,343 කට එළඹි ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු කටයුතු නොකර පවතින උද්ධමනකාරී තත්ත්වය මත එය ඉටුකළ නොහැකි බව දැනුම් දී තිබුණි. එහෙත් ඒ සඳහා කොන්ත්‍රාත්කරුට මිල විචලනයන් ලබාදීමට අනුමැතිය ලබා දී තිබුණද කොන්ත්‍රාත්කරු අදාල ව්‍යාපෘතිය ආරම්භකර නොතිබුණි, ව්‍යාපෘතිය භාර නොගැනීම හේතුවෙන් ලබාගෙන තිබූ රු.1,282,043 ක කාර්ය සාධන බැඳුම්කරය මුදල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). වැය විෂයය 620-44-04-2201(ii) යටතේ වූ දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මඟින් දෙමටවැව පහලහාපැටියාව වැව ප්‍රතිසංස්කරණය සඳහා රු.6,925,470 කට මිල ගණන් ඉදිරිපත් කර සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ලිපි යවා තිබූ නමුත් ඔහු විසින් කොන්ත්‍රාත්තුව භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබූ අතර ඔහු විසින් මුදලෙන් ඉදිරිපත් කල රු.40,000 ක ලංසු සුරක්ෂණය ආදායමට ගැනීමට කටයුතු නොකර ආපසු ගෙවා තිබුණි.

3.4. කළමනාකරණ දුර්වලතා

---

වැය විෂයය 620-44-04-2201(ii) යටතේ වූ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ අරමුදල් මඟින් 2021 වර්ෂයේදී කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා උතුරු මැද පළාතේ ගොවීන් වෙත ලබා දී තිබූ රු.49,622,607 ක වටිනාකමක් සහිත උපකරණ විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව ගොවීන් වෙත නොමිලේ ලබා දීම හේතුවෙන් සහ අධීක්ෂණ කළයුතු නිලධාරීන්ගෙන් විධිමත් අධීක්ෂණයක් නොවීම හේතුවෙන් එම උපකරණ භාවිතා කර කොම්පෝස්ට් නිෂ්පාදනයට භාවිතා නොකොට වෙනත් කටයුතු සඳහා භාවිතා කිරීමෙන් ඒ තුළින් අපේක්ෂිත වූ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ පදනමද විගණනයට පැහැදිලි නොවීය.

04. මානව සම්පත් කළමනාකරණය

------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල විස්තර පහත පරිදි වේ.

| අ.අ. | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | නත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 02 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 55 | 31 | 24 |
| (iv ) | ප්‍රාථමික මට්ටම | 13 | 10 | 03 |
| | | 73 | 44 | 29 |

ජේ.ඒ.එස්.ඇනස්ටින්,

ජේ.ඒ.එස්. ඇනස්ටින්

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

සහකාර විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය

විගණකාධිපති වෙනුවට

පිටපත්:- නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) - උතුරු මැද පළාත් සභාව

NATIONAL AUDIT OFFICE

## 04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

**ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| අනු අංකය | ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 1 | මහජන පැමිණිලි | 100% | | |
| 2 | ආයතනයේ කාර්යක්ෂමතාව | 90% | | |
| 3 | ත්‍රෛමාසික කාර්ය මණ්ඩල වාර්තා ඉදිරිපත් කිරීම. | 100% | | |
| 4 | විගණන විමසුම් හා ඊට යවන පිළිතුරු. | 100% | | |
| 5 | ගිණුම් කටයුතු | 95% | | |
| 6 | යාවත්කාලීන කරන ලද හා නඩත්තු කළ ලිපිගොනු සහ ලේඛන වල මාසික ප්‍රගතිය | 100% | | |
| 7 | මිරිදිය මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය | | | |
| | පළාතේ හදුනාත් ජලාශ සදහා 50% ප්‍රතිලාභී දායකත්වය මත මත්ස්‍ය ඇඟිල්ලන් 3, 829,770ක් මුදාහැරීම. | 100% | | |
| | 50 % දායකත්වය මත කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 08ක් සංවර්ධනය කිරීම. | | 80% | |
| | ධීවර කාර්මිකයින් 200 ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම. | 99.5% | | |
| 8 | විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය | | | |
| | විසිතුරු මත්ස්‍ය වගාවේ නිරත ව්‍යවසායකයන් 75 ක් සඳහා 50% දායකත්වය මත විසිතුරු උපකරණ ලබාදීම. | | 80% | |
| 9 | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | | | |
| | කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන හා අලෙවි | | 80% | |
| | කෘෂිකර්මය සඳහා ජලය සැපයීම. | | 75% | |
| | ව්‍යාපෘති කළමණාකරනය. | 100% | | |

**අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ කෙටි හැඳින්වීමක්,**

1. අතින් රැගෙන එන ලද මහජන පැමිණිලි, අදහස් හා යෝජනා අමාත්‍යාංශය ඉදිරිපස තබා ඇති තැපැල් පෙට්ටියට බැහැලීමේ හැකියාව, තොරතුරු දැන ගැනීමේ පනත මගින් වන ඉල්ලීම් සඳහා ඉක්මන් ප්‍රතිචාර දැක්වීම, මහජන පෙත්සම් ඉදිරිපත් වූ විට ඒ පිළිබඳව කටයුතු කිරීම.

2. ආයතනයේ කාර්යක්ෂමතාව ඉහල නංවා ගැනීම සඳහා ආයතනයේ සෑම අංශයකම උපරිම දායකත්වයක් ලැබෙන අයුරින් අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාම, ලිපි ද්‍රව්‍ය භාවිතය අවම කරමින් ආයතනය තුළ හා ඉන් පිටත හැකි සෑම අවස්ථාවකදීම විද්‍යුත් තැපැල භාවිතා කර ලිපි,ලේඛන හුවමාරු කර ගැනීම, බාහිරින් ලැබෙන ලිපි සඳහා ඉක්මන් ප්‍රතිචාර දක්වමින් ඒවා අදාල අංශ වෙත යොමු කිරීම, සුදුසුකම් සම්පූර්ණ නිළධාරින් වෙත උසස්වීම් හා වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, විශ්‍රාම ගැන්වීම් හා පරිවාස කාල වාර්තාවන් නියමිත කාල වලදී සිදු කිරීම, මාණ්ඩලික නිළධාරි රැස්වීම් හා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් නිසි කාලයන් තුළ පැවැත්වීම හා කාර්යක්ෂමතා පුහුණු වැඩසටහන් ආයතනය තුළ ක්‍රියාත්මක කිරීම.

3. අදාල කාල සීමාවන් තුල ආයතනයේ සේවයේ නියුතු නිළධාරින්ගේ කාර්යමණ්ඩල වාර්තා හා ඊට අදාල තොරතුරු නිවැරදිව යාවත්කාලීන කරමින් ආයතන කටයුතු කාර්යක්ෂමව හා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා කටයුතු කිරීම.

4. ආයතනයට ලැබෙන විගණන විමසුම් හා විගණකාධිපති වාර්තා සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමද, එම විමසුම් හා වාර්තාවලින් පෙන්වා දෙන අඩුපාඩුද නිරවුල් කරගනිමින් නිවැරදි ගිණුම් හා පාලන කටයුතු හරහා ආයතනයේ කාර්යක්ෂමතාවය උපරිම වන ලෙස කටයුතු කිරීම.

5. වවුචර්පත් හා අනෙකුත් ගෙවීම් නියමිත කලය තුළ සිදු කරමින් වැය ලෙජරය, මුදල් පොත, වැටුප් ලේඛනය, පොදු තැම්පත් ලේඛනය, සමාජීක ණය ලේඛනය වැනි ලේඛන නිවැරදිව පවත්වාගෙන යාම තුලින් මාසික ගිණුම් සාරාංශ, බැංකු සැසඳුම් ප්‍රකාශනය ඇතුලු අනෙකුත් වාර්තාවන් නියමිත කාලයන් තුල ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය, වාහන භාවිතය විධිමත්ව සිදු කිරීම මෙන්ම වාර්ෂික අයවැය සකස් කිරීම, මූල්‍ය ප්‍රකාශනය හා අත්තිකාරම් බී ගිණුම් ප්‍රකාශනය නියමිත කාලයන් තුළ ඉදිරිපත් කිරීම, විගණන කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීම වැනි කාර්යයන් හරහා ආයතනයේ ගිණුම් කටයුතු කාර්යක්ෂමව හා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කිරීම.

6. ආයතනයේ සෑම විෂයක් සඳහාම විෂය ගොණු ලේඛනයක් පවත්වාගෙන යාම තුලින් ලිපි ගොණු වල ආරක්ෂාව මෙන්ම රාජකාරී කටයුතු ඉටු කිරීමේදී පහසුවක් ඇති වන ආකාරයට ආයතනය තුළ ක්‍රියාවලියක් පවත්වාගෙන යාම, නිවැරදි කාර්යාල ක්‍රම අනුගමනය කිරීම, ස්ථාන මාරුවීම් වැනි අවස්ථාවන් වලදී ලිපිගොනු භාර ගැනීම හා භාර දීම විධිමත්ව සිදු කිරීම හා ලේඛනාගාරයක් පවත්වාගෙන යෑම වැනි කටයුතු ඉටු කිරීම.

7. විශේෂ සංවර්ධන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 13.5 ක ප්‍රතිපාදන යොදා ගනිමින් ක්‍රියාත්මක වූ මිරිදිය මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය ව්‍යාපෘතිය මගින් පළාතේ හදුනාත් ජලාශ සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත මත්ස්‍ය ඇඟිල්ලන් 3,,829, 770ක් මුදාහැරීම හා 50 % ප්‍රතිලාභ දායකත්වය මත කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 08 ක් සංවිධානය කිරීම සිදු කර ඇති අතර ඒ සඳහා වැය වූ සමස්ථ වියදම රුපියල් 12,499,960.25 කි. මීට අමතරව ධීවර කාර්මිකයින් 200 ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම ද මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කර ඇති අතර ඒ සඳහා මිලියන 4 ක ප්‍රතිපාදන යොදාගෙ ඇත. ඒ යටතේ ඔරු 45 සහ ධීවර දැල් 391 බෙදා දීම සිදුකර ඇති අතර ඒ සඳහා වැය වූ සමස්ථ වියදම රුපියල් 3,977,366.77 කි. මෙම ව්‍යාපෘතිය ආයතනයේ කාර්ය සාධන මට්ටම මෙන්ම පළාතේ මත්ස්‍ය අස්වැන්නද, ඉහල මට්ටමකට ගෙන එමින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි.

8. විසිතුරු මත්ස්‍ය කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 04 ක ප්‍රතිපාදන යොදා ගනිමින් විසිතුරු මත්ස්‍ය වගාවේ නිරත ව්‍යවසායකයන් 75 ක් සඳහා 50% ප්‍රතිලාභ දායකත්වය මත විසිතුරු උපකරණ ලබාදීම සිදු කර ඇත. එම ව්‍යාපෘතිය යටතේ වටදැල් 350 , සෙවනදැල් 75 සහ කුරුළු දැල් 100 ක් ප්‍රතිලාභීන් අතර බෙදා දීම සිදු කර ඇති අතර ඒ සඳහා වැය වූ සමස්ථ වියදම රුපියල් 2,910,215 කි. මෙම ව්‍යාපෘතිය ආයතනයේ කාර්ය සාධන මට්ටම මෙන්ම පළාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහල මට්ටමකට ගෙන එමින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි.

9. ලෝක බැංකු හා ශ්‍රී ලංකා රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ රුපියල් මිලියන 1,092,800,000 ක් උපයෝජනය කරමින් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධනය කිරීම , කෘෂිකර්මය සඳහා ජලය සැපයීම හා ව්‍යාපෘති කලමනාකරණය ආදී ක්ෂේත්‍රයන් ඔස්සේ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරමින් කෘෂිකාර්මික කටයුතු වල ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා කටයුතු සලසා දී ඇත.

## 05.පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලඟා වීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුළ ඉටු කළ කාර්යය | එම දර්ශක අනුව 2023 වර්ෂය තුළ ලබා ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 46% | 50% - 74% | 75% - 100% |
| සාගින්න නැති කර ආහාරසුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනා ගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම (41,000 mt) | ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් මුදා හැරිම | ග්‍රාමීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ජලාශ 45ක් සඳහා මත්ස්‍ය පැටවුන් මුදා හැරීම | | | √ |
| | | පෞද්ගලික මත්ස්‍ය අභිජනනමධ්‍යස්ථාන 10ක් සංවර්ධනය කිරිම | පෞද්ගලික මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 08 ක් සංවර්ධනය කිරිම | | | √ |
| | | ධීවර කාර්මිකයින් 200ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම. | ධීවර කාර්මිකයින් 200ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම. | | | √ |
| | | විසිතුරු මත්ස්‍ය වගාකරුවන් 70ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය | විසිතුරු මත්ස්‍ය වගාකරුවන් 75ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය | | | √ |

## 5.2 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය


තිරසර සංවර්ධන අරමුණු 02. යටතේ දැක්වෙන සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම යටතේ සඳහන් 2030 වනවිට ළඟාකර ගත යුතු තත්වයන් සඳහා අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් තුළින් විශාල දායකත්වයක් සපයයි. නිදසුනක් ලෙස අංක 2.1 හි සඳහන් 2030 වනවිට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන් ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුතු, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම වෙනුවෙන් අවශ්‍ය වූ සියලු කාර්යයන් සාර්ථක අයුරින් අමාත්‍යාංශය මඟින් ක්‍රියාවට නංවා ඇත. මේ අතරින් මිරිදිය ධීවර නිෂ්පාදිතය සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් සපයා ඇත.

2023 වර්ෂයේදී සමස්ත දිවයිනටම බලපාන ලද විවිධාකාර සංවර්ධන අභියෝග හමුවේ වුව ද පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතයේ සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් අත්කර ගැනීමට උතුරු මැද පළාත සමත්ව ඇත. 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික්ක දෙකෙහි මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිත ප්‍රමාණයන් වාර්තා වී ඇත්තේ පහත අයුරිනි.

**පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතය 2018 - 2023 (Mt)**

| වර්ෂය | අනුරාධපුර | පොළොන්නරුව | උතුරු මැද පළාත |
|---|---|---|---|
| 2018 | 19,940 | 11,600 | 24,540 |
| 2019 | 17,840 | 9,960 | 27,800 |
| 2020 | 21,855 | 9,505 | 31,360 |
| 2021 | 19,330 | 8,690 | 28,010 |
| 2022 | 21,800 | 13,668 | 35,468 |
| 2023 | 21,338 | 10,266 | 31,604 |

**මූලාශ්‍රය - ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය**





ජාතික මට්ටමේ මිරිදිය නිෂ්පාදිතය තුළ උතුරු මැද පළාතේ දායකත්වය 2018 වසරේ සිට 2023 වසර දක්වා පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

**<u>ජාතික මට්ටමේ මිරිදිය නිෂ්පාදිතය හා පළාත් දායකත්වය 2018-2023</u>**

| වර්ෂය | ජාතික නිෂ්පාදිතය )mt) | උතුරු මැද පළාත් නිෂ්පාදිතය )mt) | ජාතික නිෂ්පාදිතයට පළාත් දායකත්වය |
|---|---|---|---|
| 2018 | 88,010 | 24,540 | 28% |
| 2019 | 90,580 | 27,800 | 31% |
| 2020 | 102,220 | 31,360 | 31% |
| 2021 | 104,450 | 28,020 | 27% |
| 2022 | 116,890 | 35,468 | 30% |
| 2023 | 114,850 | 31,604 | 28% |

**මූලාශ්‍රය - ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය**


උතුරු මැද පළාතේ සහ ජාතික මට්ටමේ මත්ස්‍ය
නිෂ්පාදනය 2018-2023
140,000
120,000
100,000
80,000
60,000
40,000
20,000
-
නිෂ්පාදනය (mt)
2018
2019
2020
2021
2022
2023
වර්ෂය
උතුරු මැද පළාත
ජාතික මට්ටම

## 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 04 | 02 | 02 |
| තෘතියික | 01 | 01 | - |
| ද්විතියික | 55 | 31 | 24 |
| ප්‍රාථමික | 13 | 11 | 02 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ඉහත දක්වා ඇති දත්ත අනුව අමාත්‍යාංශය තුළ ජ්‍යෙෂ්ඨ,තෘතියික, ද්විතික හා ප්‍රාථමික කාර්ය මණ්ඩල වල හිගයක් පෙන්නුම් කරනු ඇත. මෙම හිගය ආයතනයේ කාර්ය සාධනය උදෙසා පහත පරිදි බලපානු ඇත.

- **ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.**

  අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) හා සහකාර ලේකම් (මුදල්) නිලධාරි පුරප්පාඩු පවතී. මෙම පුරප්පාඩු හේතුවෙන් ආයතනයේ පරිපාලනමය කටයුතු අපහසු වීම.

- **ද්විතීයික කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.**

  ද්විතික කාර්ය මණ්ඩලයට අයත් කළමනාකරණ සේවා නිළධාරීන්ගේ පුරප්පාඩු හේතුවෙන් ආයතනික කටයුතු ඵලදායි අයුරින් සිදු කිරිම ගැටලුවක් වී ඇත . තවද, සංවර්ධන නිළධාරී පුරප්පාඩු හේතුවෙන් සංවර්ධන කටයුතු මෙහෙයවීම, ක්ෂේත්‍ර අධීක්ෂණය, ප්‍රතිලාභීන් හා ආයතනය අතර සම්බන්ධීකරණ ක්‍රියාවලියට බාධා ඇති වීම වැනි ගැටලු වලට මුහුණ දීමට සිදු වේ.

- **ප්‍රාථමික කාර්යය මණ්ඩලයේ රියදුරු, කාර්යාල මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.**

  ක්ෂේත්‍ර හා කාර්යාල කටයුතු සඳහා වාහන යෙදවීමේදී ප්‍රමාණවත් අයුරින් රියදුරු සේවක මහතුන් නොමැති හෙයින් ඉලක්ක හා අරමුණු කෙරෙහි ළඟා වීමට බාධා ඇතිවීම.

**6.3** මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව(දින/ මාස/ අවු.) | සමස්ත ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමවුම/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| අන්තර්ජාලගත පුහුණු කළමනාකරණ පද්ධතිය සඳහා සම්බන්ධීකරණ නිලධාරීන් ලියාපදිංචි කිරීම. | 02 | දින 01 | | | දේශීය | TMS පද්ධතිය භාවිතය පිළිබඳ දැනුම ලබාගැනීම හා අවශ්‍ය නිලධාරින් ලියාපදිංචි කිරීම සඳහා මාර්ගගත ක්‍රමයට නම් ඇතුලත් කිරීම |
| ලිපිගොනුකරණය | 14 | දින 01 | | | දේශීය | ලිපිගොනු පවත්වාගෙන යාම හා නඩත්තුව පිළිබඳ දැනුම |
| මූලික ව්‍යාපෘති කළමනාකරණ | 14 | දින 03 | | | දේශීය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාල මූලික දැනුම |
| වත්කම් කළමනාකරණ මෘදුකාංග පුහුණුව (AMS) | 01 | දින 01 | | | දේශීය | AMS පද්ධතිය ක්‍රියාත්මක කර ගැනීමට අදාල දැනුම ලබා ගැනීම |
| ගිණුම් මෘදුකාංග (CIGAS) | 01 | දින 03 | | | දේශීය | CIGAS මෘදුකාංගය භාවිතය පිළිබඳ දැනුම ලබා ගැනීම හා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා ගැනීම |
| බහුකාර්ය සංවර්ධන නිලධාරි ප්‍රාරම්භක පුහුණුව | 04 | දින 06 | | | දේශීය | කාර්යාලගත රාජකාරී ඉටු කර ගැනීමට අවශ්‍ය දැනුම ලබා ගැනීම ( කාර්යාල ක්‍රම හා ගිණුම් ක්‍රම පිළිබඳ දැනුම) |
| නිවාඩු විෂයභාර නිලධාරින්ගේ කාර්යභාරය හා වගකීම | 01 | දින 01 | | | දේශීය | නිවාඩු විෂය සම්බන්ධ දැනුම ලබා ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පාඩු හා කපාහැරීම් හා පොතෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය | 02 | දින 03 | | | දේශීය | පාඩු හා කපා හැරීම් හ පොතෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලියට අදාල ලේඛන පිළිබඳ දැනුම හා භාවිතය පිළිබඳ දැනුම |
| මූලික පරිගණක පුහුණුව | 01 | දින 04 | | | දේශීය | රාජකාරි කටයුතු කිරීමේදී අවශ්‍ය පරිගණක දැනුම ලබා ගැනීම |
| වෙබ් අඩවි නිර්මාණකරණය | 01 | දින 02 | | | දේශීය | වෙබ් අඩවි නිර්මානකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම |
| වාහන හා වාහන ලිපිගොනු නඩත්තුව | 01 | දින 01 | | | දේශීය | වාහන විෂය සම්බන්ධ දැනුම හා ඊට අදාලව නඩත්තුවන ලිපිගොනු සම්බන්ධ රාජකාරීමය දැනුම |
| විශ්‍රාම දිවියට පෙර සූදානම | - | දින 01 | | | දේශීය | විශ්‍රාම ගැන්වීමට පෙර රාජකාරී මට්ටමින් සිදුකර ගත යුතු කටයුතු පිළිබඳ දැනුම |
| රාජ්‍ය නිලධාරින්ගේ විනය කාර්ය පටිපාටි | - | දින 03 | | | දේශීය | රාජ්‍ය නිලධාරින්ගේ විනය ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය දැනුම |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වූයේ කෙසේදෙ? යන්න කෙටියන් පැහැදිලි කරන්න.

- පුහුණු වැඩසටහන් මඟින් අදාල නිලධාරින්ගේ න්‍යායාත්මක දැනුම වර්ධනය වන අතර, එමඟින් මහජනතාවට ඵලදායි සේවයක් ලබාදීමට ඇති හැකියාව වර්ධනය වේ.

- ආයතනයේ මෙහෙයුම් කටයුතු නිවරදි අයුරින් පවත්වාගෙන යාමට හා ආයතනයේ අරමුණු හා ඉලක්ක සාර්ථකව සපුරා ගැනීමටත් පුහුණු වැඩසටහන් දායක වේ.

- විවිධ ක්ෂේත්‍ර ආවරණය වන අයුරින් නිලධරයන් විවිධ පුහුණු වැඩසටහන් වලට ඉදිරිපත් කිරිම තුළින් ඔවුන්ට ආයතනයේ සියලු රාජකාරී කටයුතු පිලිබඳ දැනුම ලබා ගැනීමට හැකියාව පවතින අතර, ඔවුන්ට ඕනෑම ස්ථානයක ඕනෑම රාජකාරී කටයුත්තක් කිරිමට සුදුසු පුද්ගලයෙකු බවට පත් කිරිම මෙම පුහුණු වැඩසටහන් මඟින් සිදු වන ප්‍රධානම කර්තව්‍යයකි.

- පුහුණු වැඩසටහන් මඟින් නිලධාරින්ගේ දැනුම, ආකල්ප වර්ධනය වීම මඟින් ආයතනය තුලින් රටෙහි අපේක්ෂා කරන දායකත්වය ඉහල මට්ටමක පවත්වා ගෙන යාමට හැකි වේ.

## 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදළ කර ගතයුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **<u>පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේද?</u>** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ. | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම. | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම. (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම. | - | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම. | - | - | - |
| 1.6 | වෙනත් ගිණුම්. | - | - | - |
| | | | | |
| **2** | **<u>පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (ප.මු.රී 321)</u>** | | | |
| 2.1 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2014/14 හා 2016/10 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගලික පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.3 | විගණනවිමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට පළාත් භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.(ප.ස 37 පෝරමය) | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (ප.ස 32 පෝරමය) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (ප.මු.රී 83)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා සිදුවන පරිදී බලතල පවරාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණරාජ්‍ය ගිණුම් චක්‍රෙල්ඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| 3.5 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2022.11.23 දිනැතිව නිකුත් කර ඇති අංක 04/2022 චක්‍රලේඛය හා 2023.01.05 දිනැතිව පළාත් භාණ්ඩාගාර විසින් නිකුත් කර ඇති NCP/CS/PT/ICTO/GPS දරන ලිපියට අනුකූලව GPS මෘදුකාංගය හරහා වැටුප් සකස් කිරීම. | අනුකූල වේ | | |
| | | | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | නියමිත දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | නියමිත දිනට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | නියමිත දිනට වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | නියමිත දිනට වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට පළාත් අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 4.5 | නියමිත දිනට වාර්ෂික අග්‍රිම සීමා වාර්තාව පළාත් භාණ්ඩාගාර ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| | | | | |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 5 | විගණන විමසුම් | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| 6 | අභ්‍යන්තර විගණනය | | - | - |
| 6.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, වසර ආරම්භයේ දී අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | - | - |
| 6.3 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| 7 | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරන කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබිම. | අනුකූල වේ | - | - |
| | | | | |
| 8 | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | පළාත් සභාව සතු වත්කම් කළමණාකරණය සම්බන්ධ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2014/14 හා 2016/10 අනුව වත්කම් මිලදී ගැනීම, නිකුත් කිරීම හා අපහරණය කිරීම පිළිබද කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.2 | කොන්ට්‍රෝල ජනරාල්ගේඅංක 01/2017 දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සදහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබද තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.3 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක2020/14 අනුව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිතභාණ්ඩ අපහරණය කිරීම ප.මු.රී 490 අනුව සිදු කිරීම. | අනුකූල වේ | - | - |
| 8.6 | කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ 2022.09.09 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | අංක 10/2022 ප්‍රකාරව ආයතනයේ එකත් වී ඇති අබලි ද්‍රව්‍ය බැහැර කර තිබීම. | | | |
| | | | | |
| **9** | <u>වාහන කළමනාකරණය</u> | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්භිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම ප.මු.රී 54 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල නොවේ | අනතුරු සිදුවී නැත. | - |
| 9.5 | ප්‍රධාන ලේකම්ගේ NCP/CP/FD/08 හා 2017.08.08 දිනැති ලිපිය ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම. | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාල නොවේ | කල්බදු වාහන නොමැත. | - |
| | | | | |
| **10** | <u>බැංකු ගිණුම් කළමනාකරණය</u> | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | අක්‍රීය බැංකු ගිණුම් නැත. | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **11** | <u>ප්‍රතිපාදන උපයෝජනය</u> | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | - |
| 11.2 | ප.මු.රී. 46 ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදී බැරකම්වලට එලඹීම. | අනුකූල වේ | - | - |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටිණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | - |
| | | | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | - | - |
| 13.2 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 572 අනුව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | ප.මූ.රී. 259 අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය පළාත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | ප.මූ.රී. 261 ප්‍රකාරව, නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාරයය අවසන් වී සතියක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.3 | ප.මූ.රී. 261 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසී වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල නොවේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට රැස් කරනු ලබන අවස්තාවේම ඍජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල නොවේ | - | - |
| 15.3 | ප.මූ.රී. 116 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල නොවේ | - | - |
| | | | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවත්වාගෙන යාම හා වැටුප් ගෙවීම. | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබද තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ ආයතනය පිළිබද මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල නොවේ | * වෙබ් අඩවිය සකස් කර තිබුණද වරින් වර සංශෝධනය කල අතර, එය ජනගත කිරීමට ඉඩ ප්‍රස්ථාව නොවීම. | - |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (I)දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම. | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම . | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සදහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සදහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **20** | **<u>විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.</u>** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සදහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | - | - |

ඩබ්.ජී.ඩබ්.වනසිංහ.
ලේකම් ,
කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා
සත්ව සෞඛ්‍ය,සහ ධීවර කටයුතු පිළිබද අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

සකස් කළේ,

අත්සන : …………………….

නම : ඒ.එච්.එස්.අයි.එම්.මැණිකේ

තනතුර : කළමනාකරණ සේවා නිලධාරි

අධීක්ෂණය,

අත්සන : …………………….

නම : ඒ.යූ.ජී.ටී. නන්දසිරි

තනතුර : සහකාර ලේකම් (මුදල්)

අනුමත කරමි,

අත්සන : …………………….

නම : ඩබ්.ජී.ඩබ්.වනසිංහ

තනතුර : ලේකම්, කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය, උතුරු මැද පළාත.